GMOA

ESTABLISHED IN
1926
TU No. 291

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION

No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2013/11/27

## මාධ්‍ය නිවේදනයයි

**මහජන සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විද්වත් උපදේශන රහිතව සිදු කරන වෙනස්කම් නිසා ක්ෂේත්‍ර සේවාවන් බිඳ වැටීම**

ශ්‍රී ලංකාව තුල සෞඛ්‍ය දර්ශක ඉහල මට්ටමක පවත්වා ගැනිම සඳහා මහජන සෞඛ්‍ය ක්ෂේත්‍රයෙන් ඉටු වන සේවය අවිවාදිතය.

කෙසේ නමුත් මෑතක සිට මතුව ඇති කණගාටුදායක ප්‍රවණතාව නම් මහජන සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳ කිසිදු දැනුමක් නොමැති වෘත්තිය සමිතියකට නායකත්වය දෙන හිමිනමකගේ වැරදි මග පෙන්වීම් නිසා මහජන සෞඛ්‍ය ක්ෂේත්‍රය තුල අර්බුද රාශියක් නිර්මාණය වී ඇති බවයි.

මෙහි කූඨප්‍රාප්තිය ලෙස මෙතෙක් කලක් පැවති පිළිගත් මහජන සෞඛ්‍ය ව්‍යුහය බිඳ දමමින් විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරින් හෙද පාලිකාවන් ලෙස සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල වලට අනුයුක්ත කර ඇත. මෙම පත්කිරීම් සිදු කිරීමේදී මහජන සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාල කිසිදු පාර්ශවයක විශේෂඥ මතය විමසීමක් සිදු කර නොමැති අතර පිලිගත් සම්මතයක් දරුණු ලෙස බිඳ දමා ඇත.

මේ තත්ත්වය යටතේ මහජනතාවට වන හානිය අවබෝධ කරගත් රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය පසුගිය ඉරිදා මහජන සෞඛ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධ විශේෂඥ වෛද්‍යවරුන්ගේ වැඩ මුළුවක් සංවිධානය කරන ලදි. එහිදි ඇති වූ එකගතාවයන්ට අනුව මේ තත්ත්වය කිසිසේත්ම පිලිගත නොහැකි බවත් වහාම අදාල හෙද පාලිකාවන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල වලින් ඉවත් කල යුතු බවත් ඒකමතිකව තිරණය විය.

එමෙන්ම මෙම හිමිනමගේ බලපෑමෙන් රෝහල් සූතිකාගාර වලින් විධිමත් පුහුණුවක් ලද පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් ඉවත් කොට වෙනත් තාක්ෂණික සේවාවක් සිදු කිරීමට නියමිත හෙද නිලධාරින් යෙදවීමට ගෙන ඇති තිරණයනට දැඩි ලෙස විරුද්ධ වීමටද තිරණය විය.

මේ තත්ත්වයන් නිසියාකාරව ඇගයිමට ලක් කර එකගතාවයකට එළඹෙන තෙක් පැවති සම්මතයන්හි කිසිදු වෙනසක් සිදු නොවිය යුතු බවත් යම් ස්ථානයක දැනටමත් එවන් වෙනස්කම් සිදුව ඇත්නම් වහාම එම තත්ත්වයන් නිවැරදි විය යුතු බවත් ඒකමතිකව තිරණය විය.

මෙම තිරණ ක්‍රියාත්මක කරවීම සඳහා හිමිනමගේ බලපෑම හේතුවෙන් සෞඛ්‍ය බලධාරින් කටයුතු නොකලහොත් මහජන සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඉදිරි ගමන වෙනුවෙන් දැඩි වෘත්තිය සමිති ක්‍රියාමාර්ගයකට අවතිර්ණ වීමට රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය ලෙස අප පසුබට නොවෙමු.

දෙසැම්බර් 05 වන බ්‍රහස්පතින්දා පැවැත්වෙන විධායක කමිටු රැස්වීමේන් මේ සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගැනිමට නියමිතය.

ස්තුතියි

වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්

වැඩිදුර විස්තර - වෛද්‍ය නවීන් සොයිසා - 0718582444
වෛද්‍ය හරිත අළුත්ගේ - 0718121619